දිනමිණ The Dinamina ePaper

| 100% |

විශිෂ්ටයන්ගේ
අතිවිශිෂ්ටයන් බිහිකරන
පාඩම් මාලාව **4**

බුද්ධි කලම්බනයක නවමු මඟ

ශ්‍රී ලංකා පරිපාලන සේවා විවෘත තරඟ විභාගය

මෙම පාඩම් මාලාව පහත සඳහන් විෂයයන් හතරම ආවරණය කරනු ලබයි. සාමාන්‍ය බුද්ධිය, සාමාන්‍ය දැනීම, රචනය හා සාරාංශය, කළමනාකරණ අභියෝගතාවය, මෙම විෂයයන් ප්‍රශ්න පත්‍ර හතරක් ලෙසින් පහත පරිදි විභාගයට ලැබේ.
සාමාන්‍ය බුද්ධිය කාලය පැය 1 යි - බහුවරණ ප්‍රශ්න 50 යි ලකුණු 100යි
සාමාන්‍ය දැනීම කාලය පැය 2යි බහුවරණ 50 යි, ව්‍යුහගත 25 යි ලකුණු 100යි
රචනය හා සාරාංශය කාලය පැය 2 යි රචනය වචන 200කි,සාරාංශයක් ලැබු ලකුණු 100යි.
කළමනාකරණ අභියෝගතාවය කාලය පැය 2 යි බහුවරණ 50යි ව්‍යුහගත 25 යි ලකුණු 100 යි.

රචනය හා සාරාංශය – 2

පර්යාය පද හා සමාන පද

මී – මීයා, පොළොව, මධු, මීමා
පා – පාදය, පදම, පාවීම, පාත්‍රය
කර – අත, බෙල්ල, රශ්මිය, මුහුද
නිදන – හේතුව, නිදා ගැනීම, දිළිඳු, නිධානය
නෙළුම් – තාමරස, පඬෝ, අම්බුජ, සහශ්‍ර පත්‍ර
සමූහය – කැල, ගණ, මුළ, වැට
බැබළෙන – ප්‍රභා, ජ්වලිත, දුල, දීප්ති
පිළු – කොරා, බධිර, බිහිරා
බුදුන් වහන්සේ – තිලොව'ග, සමතැස්, සවන්, මොනැඳුරු, දියබජ්, සතර, දියතා, දිනිඳු, මරරුපු, දිනිසුරු, දසබල, තිලෝනා
දෙවියන් – අමපා, මුරු, සුර, දෙව්, දික්පති, පුරන්දර, පඬුරු
විෂ්ණු – නාරායණ, ශ්‍රී පති, ලක්ෂ්මීපති, කමලපති
ශක්‍රයා – සුරරද, සක්දෙව්, විදුරව්, දද, අමරපති
කතරගම දෙවිඳුන් – බරණෙත, ස්කන්ධ කුමාර, කඳ සුරිඳු, කඳ කුමරු
ඊශ්වර – තිනෙත්, ත්‍රිනේත්‍ර, නීලකණ්ඩ, බරණිඳු, ළය
මුහුද – සමුද්‍රය, සිලිලාර, කර, සමුදුර
හස්තය – අත, බාහු, බා, කර, බුජ
වඳුරා – වානරයා, ශාඛාමෘග, සාමුව, ගොනාහුල්
දේදුන්න – දෙවිඳු සැව්, ඉන්ද්‍ර චාප, ඉඳු සැව්
හිවලා – නරියා, සිගාලයා, ශෘංගාලයා, කැණහිලා
ත්‍යාගය – පඬුරු, ප්‍රසාද, තෑගි, පියලි, තිළිණ, පණයම්
අක්කිත්ත – අග අත්ත, අත්තේ අවසන් කෙළවර
අක්කිත්තා – පවුලක අග තැනැත්තා, අන්තිමයා, බාලයා, බඩපිස්සා
අක්කු – මවගේ කිරි, තන කිරි
අක් ගහනවා – අග ගසා දමනවා, කෙළවර කපා දමනවා
අක්පය – පයේ අග කොටස, අග කෙළවර, ඇඟිලි ප්‍රදේශය
අක්ක බක්ක වෙනවා – සියල්ල නැති වෙනවා, සහමුලින් වැනසී යනවා
අක්ෂ ශෞණ්ඩ – සූදු ක්‍රීඩාවේ ඇලුණු
අක් සන – පොතේ පිටුවෙහි අග යොදා ඇති සලකුණ
අගණිත – ගණන් කර නැති, අප්‍රමාණ, අනන්ත
අඛිල – සියලු, සකල, සම්පූර්ණ
අඛ්‍යාත – නොකියූ, අප්‍රසිද්ධ
අගද – ලෙඩ නැති, නිරෝගී
අගමනීය – නොයා යුතු, නොපැමිණිය යුතු, යෑම සුදුසු නැති
අගමැණ – අග්‍ර මාණික්‍යය, මුදුන් මිණ
අග සස් – පළමුවෙන්ම ලැබෙන අස්වැන්න
අගාරවය – ගුරු නොකිරීම, නොසැලකීම, අවමානය
අගම්‍ය – ගිය නොහැකි, ළඟාවිය නොහැකි, නොවැටහෙන
අගෝනීය – කරදර, හිරිහැරය, කණගාටුව
අගු වඩනවා – අගය වඩනවා, අගය වැඩි කරනවා, වටිනාකම වැඩි වෙනවා

අවේල/ අවේලක – රෙදි නොඇඳින, හෙලු, නිර්වස්ත්‍ර, නිරුවත්
අණගිල්ල – දඹරගිල්ල
අඩ්ඩා – අන්තිමයා, කෙළවරේම සිටින්නා
අණුතර – ඉතා සුළු
අණ කියනවා – අනුහස මතක් කරනවා
අඩ තලනවා – කෑ ගසනවා
අණ්ඩ මෝචනය – බිත්තර දැමීම
අතම්මයතා – තණ්හාව නැති බව, ආසා විරහිත බව
අතපත්තු – සිංහල රජ කාලයේ අත් තුවක්කු හමුදාංකය
අතැඹුල – යමක් පිළිබඳව ඇති පැහැදිලි අවබෝධය
අත වැඩි මගුල – විවාහ මංගල්‍යය, අතිනත ගැනීමේ උළෙල
අතාවුද – ආවුද ගෙන හේවාකම් කළ මුර භටයා
අති ඉෂ්ට – අතිශයින් කැමති වූ, ඉතා ප්‍රියංකර
අති ක්‍රමණ – නීතියක්, සීමාවක් හෝ කඩඉමක් ඉක්මවා යෑම
අතිජාත – මාපියන්ට වඩා උසස් ගති ඇති
අති දණ්ඩ – දැඩි දඬුවම්, බරපතල දඬුවම්
අති මිත්‍ර – හොඳම යහළුවා
අත්ථංගත – ඉර බැස යෑම
අත්තලය – අල්ල, අත්ල
අත්කඩය – ලේන්සුව
අත්ථි සුඛ – දැහැමෙන් උපයා ගත් වස්තුවක් තමා සතුව ඇතැයි දැනෙන සුවය
අත්පස් ගෙය – මල මුත්‍රා පහ කරන තැන, වැසිකිළිය
අත් බව/ අත්බැව – මනුෂ්‍යයාගේ, සත්වයාගේ ජීවිතය, සත්වයා යම් තැනක ලබන උපත
අත්‍යචාර – ආචාර ධර්ම ඉක්මවීම, අනාචාරයේ හැසිරීම
අත්‍යාදර – අධික ආදරය, දැඩි සෙනෙහස, අති ආදරය
අත්‍යානන්දය – ඉතා සතුට, අධික සන්තෝෂය, අති ආනන්දය
අත්‍යායත – ඉතා දිගු, බොහෝ දිග ඇති
අත්‍යායික – හදිසි, යුහුසුලු, ඉක්මනින් කළ යුතු
අත්‍යාලය – ඉමහත් ඇල්ම, අති ආලය
අත්‍යුක්තිය – සීමාව ඉක්මවූ කියමන, අධික වර්ණාව
අත්‍යුග්‍ර – ඉතා දැඩි, අතිශයින් බලවත්, ඉතා දරුණු
අත්‍යුත්කෘෂ්ට – ඉතා උසස්, ඉතා උතුම්, ශ්‍රේෂ්ඨ
අත්‍යුත්තුංග – ඉතා උස්, බොහෝ උසැති
අත්‍යුත්සන්න – ඉතා අමාරු, බලවත්, ඉතා එසවුණු
අත්‍රාණ – රැකවරණයක් නැති, පිහිටක් නැති
අත්වට – සහල් පිටි බැද පැණියෙන් අනා ගුලි කර ගත් කැවිලි, අග්ගලා
අත් වතු – ගණන් ලේඛන, ගණන් වාර්තා
අත්තිත් – අදහස්, ගති ගුණ
අද කෙළිය – අනංග ක්‍රීඩාව, කාම සේවනය, සම්භෝගය
අදත් – දුත්තේ නැති, හුදුත්
අදමනීය – දමනය කළ නොහැකි. හික්මවා ගන්නට බැරි
අදස – මුහුණ බලන කණ්ණාඩිය, කැඩපත
අදරස – දිය නුමුසු රස, අමිශ්‍ර රසය, නව රසය
අද වක / අදවක් – අද දිනය, මේ දවස
අදළ – දැඩි නොවූ, මොළොක්, සිහින්
අදිටු – ඇසින් නුදුටු, නොදක්නා ලද
අදිස්න – නොපෙනෙන, අදෘශ්‍යමාන
අධෝ මංචක – ඇඳ යට
අනල්ප – බොහෝ, අනේක
අනවරා – අනෝරා, නොකඩවා
අනාඛ්‍යාත – නොකියූ, ප්‍රකාශ නොකරන ලද, විස්තර නොකළ
අනාචරිය/ අනාචරියක – ගුරුවරයකු නැතුව උගත්, ගුරුවරයකු නැති
අනාණ – ණය නැති, අනණ
අනා දවස – අනාගත කාලය
අනාදනය – නොගැනීම, නොපිළිගැනීම
අනාමක – නමක් නැති
අනාවිල – නිර්මල, ප්‍රසන්න, නොකැළඹුණු
අනිල රුපු/ අනිල රිපු – එඬරු, එරඬු
අනියම් නිවාඩු – කලින් අනුමත නොලබා හදිසි කටයුත්තකට ගන්නා නිවාඩු
අනියම් රුජා – නියම විලිරුජාවට ප්‍රථමයෙන් ගර්භනී මවකට සැදෙන වේදනාව
අනියම – හදිසි අවස්ථාව
අනු අනුපස්සනා – නැවත නැවත බැලීම
අනුචාර – පස්සෙන් යෑම, අනුගමනය
අනුප්‍රාණ – ශක්තිය
අනු පිළිවෙත – සුදුසු වූ ප්‍රතිපත්තිය, අනුකූල වූ
අන්ත කරනවා – කෙළවර කරනවා. අවසාන කරනවා
අභිචර – අනුගාමිකයා, සේවකයා
අම ද – මඳ නොවන, බොහෝ
අමදිනී – මව, මෑණි, මුස්න, කොස්ස
අමත – මරණයක් නැති බව, නිර්වාණය
අමළිය – අධික කම, බහුලත්වය, හදිසිය
අමා කැන් – සඳ, චන්ද්‍රයා
අමියුම – කෑම, අනුභව කිරීම, වැළඳීම

අම්බරුවා – ගවයා, මීමා, මහ අං ඇත්තා
අමේය – මැනිය නොහැකි, සීමා රහිත
අම්බැට්ටයා – දැලි රැවුල් බාන්නා
අම්මි – මිරිස් ගල, පරඅම්මා
අරන් – වනය, කැලෑව, ආරණ්‍ය
අරපැටියා – බදනා, දුවගේ ස්වාමිපුරුෂයා
අරුණ ප්‍රභා – හිරු උදාවන්නට පළමු පෙරදිග අහසේ දක්නට ලැබෙන මඳ රතු එළිය.
අල්ල පනල්ල – ළඟදී, වැඩි කල් යා නොදී, කලබලයේ, ලහි ලහියේ
අඹ – ස්ත්‍රිය, බිරිය, මව, ජලය, වලාකුළු, අඹ ගෙඩිය
අසුන් – ආසන, හසුන්පත්, අශ්වයන්, පණිවිඩ
අත් – අර්ථ, හස්ත, ස්වකීය, තම, ආත්ම, අන්ත
අඹර – වස්ත්‍ර, අහස
ඉසුරු – නායක, උත්තමයා, අධිපති, ඊශ්වරයා, ඓශ්වර්ය
උදය – උදාවීම, පහළවීම, දියුණුවීම, ප්‍රබෝධය, උදේ කාලය
උත්තර – උත්තම, උසස්, විසඳුම්, පිළිතුරු, උතුරු දෙස
කලා – කොටස, ශිල්ප, චන්ද්‍රයාගේ දහසෙන් කොටසක්
කිවි – පණ්ඩිතයා, සිකුරු ග්‍රහයා, වඳුරා, කවියා
කඩ – කඩය, රෙදි, වෙළඳසැල්, කැබැල්ල, කොටස
කල් – මනහර, ස්වාමියා, කාන්තාව, කාලය, කලු
කෝටි – අග, මුදුන, සංඛ්‍යාව, කෙළෙවර
කම් – අනංගයා, කර්මාන්ත, කාමය, කර්මය
තිර – පහන් වැටි, කඩතුරා, තද, ස්ථිර
දන – ජනයා, දානය, දැවෙන, ධනය
දිය – ලණුව, ලෝකය, ජලය, ජය
නිය – න්‍යාය, නුවණ, ගන, නීතිය, නියපොතු, නියදිය
නා – නාගස්, ඇතා, නායක, උත්තම, නා, ස්නානය
පිය – පියා, පියාපත්, හිමියා, ප්‍රියාව, ප්‍රිය බව
පද – පාද, වචන, පා, පා ලකුණ, පදවි
පට – එතිම, පටරෙදි, කොන්, වස්ත්‍ර
බුහුමන් – ගෞරව, සංග්‍රහ, සැලකිලි, සම්මාන, පැසසුම්, ගරුසර, ගරුහරු, උපහාර, බහුමාන, ප්‍රශංසා
විස්ම – පුදුම, ආශ්චර්ය, කුතුහල, මවිත, අරුම, අහුත, අද්භූත, අබිරු
තැන – ප්‍රයත්නය, උත්සාහය, වීර්යය, යත්නය, දිරිය, ධෛර්ය, ආයාසය, වෑර, ශ්‍රමය, ශක්තිය, වෑයම, පරිශ්‍රමය
කිංකිණි – කිකිණි, රසු, රහු, ගිගිරි, සිළම්බු, සළඹ, පාද ජාලා, අන්දු
නියත – අනිවාර්ය, ඒකාන්ත, ස්ථිර, නිත්‍ය, අව්‍යාජ, නියම, අචල, තිර, සතිර, සත්‍ය
අකලංක – නිශ්කලංක, නිර්දෝෂී, නිකැළැල්, නිර්මල, පිරිසිදු, පරිශුද්ධ, විමල, කමල, අමල, නිමල, සුනිමල, සුවිමල, සුදෝසුදු, නිකසල, නිදෙස්, සුපිරිසුදු, නිකිලිටි, නිෂ්ක්ලිෂ්ට, නික්ලේශී, නිකෙලෙස්
ගැරහුම් – නින්ද, ගර්හා, අවමන්, අපහාස, පරිභව, පරිහාස, නිගා, නිග්‍රහ, අපභාෂණ, බිණුම්, නිගරු, දෝෂාරෝපණ, දෙස්, අගරු, අවමාන
සොම්නස – ප්‍රීතිය, සන්තෝෂය, සතුට, ප්‍රීණනය, තුෂ්ටිය, සංතුෂ්ටි, තුට, අහ්ලාදය, ප්‍රමෝදය, පමොද, අමොද, ආනන්දය, අනඳ, හර්ෂය
මානනීය – ආඩම්බර, ප්‍රෞඪ, ගර්ව, උඩඟු, අභිමාන, අහංකාර, දර්ප, එඩි, දප්, පුවල, සාභිමාන
අනුබල – උදවු, උපකාර, උපයෝගී, දිරි, වැර, වීරිය, පිටිවහල්, රුකුල්, සංයෝග, සහාය, පිහිට, සරණ, පිළිසරණ
ප්‍රණාමය – අභිවන්දනය, වැඳීම, නමස්කාරය, අභිවාදනය, වන්දන, නැමැදීම, ගෞරව, පණමේ
භද්‍ර – යහපත්, සොඳුරු, සුන්දර, සාධු, සුඩි, හුදී, බහදුරු, බාදුරු, කළණ, කල්‍යාණ, මනඃකල්‍ය, මනෝඥ, ළ–කල, මන කල්
කැමැති – ආශා, රුචි, සතුටු, ප්‍රිය, අභිමත, සිතැ'ගි, රිසි, මනාප, අභිලාෂ, එකඟ, නඳන, අභිරුචි, අභිනන්දන, නන්දන, ආනන්ද, සංතුෂ්ටි, දෙළ, තුටු
පණ්ඩිත – පඬි, සේ, ජෙක, බහුශ්‍රැත, උගත්, වියත්, පාඟු, නැණ'සුරු, විවුද, විශාරද, නෛපුණ්‍ය, බුද්ධිමත්, ව්‍යක්ත, විදග්ධ
ඓශ්වර්යමත් – ඉසුරුමත්, ධනේෂ්වර, ධනවත්, පොහොසත්, ඉසුරුසිරි, සමෘද්ධිමත්
හද්දිග්බාගේ – හැම තැනම, සියලු තැන්වල, මුළුමනින්ම, දස දිසාවෙම
තිට්ටාවට – සම්පූර්ණයෙන්, මුළුමනින්ම, දිවි ඇති තෙක්, යළි ඇති නොවන සේ
දත් – දද, දන්ත, දසන්, දළ, රදන
දක්ෂයා – ප්‍රවීණයා, බුහුටියා, සමතා, සූරයා
කතාව – පුවත, ප්‍රබන්ධය, වත, හැල්ල, අන්දරය
කුසල – දහම, දම්, පින්, සිරි, සුසිරි

රචනය හා සාරාංශය -2 - i බදාදා පත්‍රයේ

ඉදිරිපත් කිරීම
අනුෂා ගෝකුළ ප්‍රනාන්දු
අධ්‍යක්ෂ බස්නාහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව

දිනමිණ පුවත්පත ඔබට ලබා ගැනීමේ අපහසුතා ඇත්නම් පුවත්පත් බෙදා හැරීමේ කළමනාකරු, 011 2429371, දුරකථන අංකයට හෝ 011 2429378 සහ 011 2429776 යන දුරකථන අංකයන්ට අමතා හෝ 011 2429470 යන Fax අංකයට දන්වා විස්තර ලබා ගන්න.

■■■■■■■ ■■■■■■■■■ ■■■■■■■ ■■■■■■■■■■■ ■■■■■■ ■■■■■ © 2010 ■■■■■■ ■■■■■■■■ ■■■■■■■■.

Web2PDF
converted by Web2PDFConvert.com